**ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය - 2023**

---------------------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාලය විසින් පවත්වා ගෙන ගොස් තිබූ මුද්‍රණාලය විධිමත් අනුමැතියකින් තොරව ස්වාධීන ව්‍යාපාරයක් ලෙස ක්‍රියාත්මක කිරීමත් ඒ සඳහා රු.5,000,000 ක ණය මුදලක් විශ්වවිද්‍යාලය මඟින් ලබා දීමටත් 2023 මාර්තු 07 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි. මේ අනුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 42,76 හා 99 ඡේදයන්ට පටහැනිව ඉහත දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු. 18,504,114 ක් වූ මුද්‍රණාල ආදායම, රු.8,433,158 ක් වූ මුද්‍රණාල වියදම, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට එහි රු. 2,196,774 ක් වූ අවසන් තොගය සහ රු.4,497,914 ක් වූ ණයගැතියෝ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් නොකිරීමෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම්, වියදම් සහ ජංගම වත්කම් එම වටිනාකම්වලින් අඩුවෙන් දක්වා තිබුණි. | 2023.03.08 දින සිට මෙම විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් මෙම මුද්‍රණාලයේ කටයුතු ස්වයං මූල්‍ය ස්වාධීන ඒකකයක් බවට පත්කර ඇත. මෙය විශ්වවිද්‍යාල ගිණුම්වලින් බැහැරව ස්වයං මූල්‍ය ඒකකයක් ලෙස ගිණුම් පවත්වාගෙන යනු ලැබේ. | සමාලෝචිත වර්ෂයේ මුද්‍රණාල ආදායම, වියදම හා වත්කම් වටිනාකම් මූල්‍ය ප්‍රකාශ තුළ ඇතුළත් කළ යුතු වීම. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 1 හි 42 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශන තුල අයිතමයන් ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය එක් කාල පරිච්ඡේදයක සිට ඊළඟ කාල පරිච්ඡේදයට නොවෙනස්ව තබා ගත යුතු නමුත් රු.2,428,800 ක් වූ උපස්ථායක ආදායම සමාලෝචිත වර්ෂයේදී රෝහල් ආදායමේ වෛද්‍ය පරීක්ෂණ ආදායම තුල හා රු. 195,046,194 ක් වූ ඉගැන්වීම්/පුහුණු අදායම, පාඨමාලා ආදායම තුල ඇතුලත් කර තිබූ අතර ඉකුත් වර්ෂයේදී මෙම ආදායම් පිළිවෙලින් විවිධ ආදායම් ලෙස හා රෝහල් ආදයමෙහි ඉගැන්වීම්/පුහුණු අදායම ලෙස දැක්වීමට කටයුතු කර තිබුණි. | වර්ගීකරණ දෝෂයක් හේතු කොට ගෙන මෙම වටිනාකම අනෙකුත් ලැබීම් යටතේ වර්ගීකරණය කර ඇත. ඉදිරියේදී නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 127 ඡේදය ප්‍රකාරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය මුහුණතෙහි ඉදිරිපත් කර නැති ශ්‍රී.ල.රා.අ.ගි. ප්‍රමිතවලින් අවශ්‍ය කෙරෙන තොරතුරු සටහන් මඟින් හෙළිදරව් කළ යුතු වුවත්, රු.9,554,938 ක ලැබිය යුතු ආදායම් බදු හා රු.1,422,624 ක වර්ෂයේ ආදායම් බදු පිළිබඳ සටහනක් මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කර නොතිබුණි. | විගණන විමසුම හා එකඟ නොවෙමි. රු.9,554,938 ක් වූ ලැබිය යුතු ආදායම් බදු ජංගම වගකීම් යටතේ ශේෂ පත්‍රයේ මුහුණතෙහි දක්වා ඇති අතර, රු.1,422,624 ක් වූ වර්ෂයේ ආදායම් බදු වටිනාකම ආදායම් බදු ලෙස ආදායම් ප්‍රකාශයේ මුහුණතෙහි දක්වා ඇත. | ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | විවිධ මූලාශ්‍ර වලින් ලද පර්යේෂණ ප්‍රදාන පෙර වර්ෂවලදී වැරදි ගිණුම්කරණ ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් ආදායමට හා වියදමට හඳුනාගෙන තිබුණි. මෙම වර්ෂයේ ලද එවැනි ප්‍රදාන ඒවායේ ස්වරූපය අනුව පර්යේෂණ ප්‍රදාන යටතේ වගකීම් ලෙස හඳුනා ගනු ලැබුවද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 හි 47 වගන්තිය ප්‍රකාරව ආරම්භ ශේෂයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කර නොතිබීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට පර්යේෂණ ප්‍රදාන රු.44,178,343 ක හර ශේෂයක් වත්කම් ලෙස හඳුනා ගෙන තිබුණි. තවද, මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනට පර්යේෂණ ප්‍රදාන රු.38,678,752 ක හර ශේෂයයක් පැවති අතර උපලේඛන අනුව එය රු.25,322,871 ක් වූ බැවින් රු.64,001,623 ක වෙනසක් පැවතුණි. | විගණන විමසුම හා එකඟ වෙමි. නිවැරදි කිරීමට කටයුතු කෙරේ. | ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 14 හා 69 ඡේදයන්ට පටහැනිව, රු.6,489,177 ක් වැය කරමින් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කෞතුකාගාරයේ පවතින වහල අළුත්වැඩියා කිරීම 2021 නොවැම්බර් 11 දින අවසන් වී තිබියදී 2023 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රාග්ධනිත නොකර කෙරීගෙන යන වැඩ තුල ඇතුලත් කර තිබුණි. ඒ අනුව ප්‍රවර්ථන වර්ෂයේ ගොඩනැගිලි එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබූ අතර, වර්ෂයේ ක්ෂයවීම් රු.162,229 කින් අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ඌණතාවය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | විගණන විමසුම හා එකඟ වෙමි. සිදුකෙරෙමින් පවතින වැඩ නිමි වැඩ වලට මාරු නොකිරීම නිසා ශේෂ පත්‍රයේ වත්කම් වල වෙනසක් සිදු නොවුවද අදාල ගැලපීම් සිදු කිරීමට සටහන් කර ඇත. | ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ දී ලබා දී තිබූ රු.162,029 ක් වූ මුදල් අත්තිකාරම් සඳහා විශ්වවිද්‍යාලය සතුව තොරතුරු නොතිබීමෙන් බොල් ණය හා අඩමාණ ණය වෙන්කිරීම් ලෙස ගැලපීමට සිදු වී තිබුණි. තවද, රෝහලේ රු.716,578 ක ගැණුම් අත්තිකාරම් මුදලක් බැර ශේෂයක් ලෙස ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයට ඇතුලත් කිරීමෙන් හා වැටුප් අත්තිකාරම් රු.38,784 ක් බැර ශේෂයක් ලෙස පෙන්නුම් කිරීමෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට වත්කම් රු. 917,391 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේදී සයිටම් අරමුදලින් වෛද්‍යපීඨ විභාග පැවැත්වීම සඳහා ලබා දී ඇති රු.34,500 ක් සහ දක්ෂිණ මණ්ඩපය මගින් ලබාදුන් රු.127,584 ක මුදල් අත්තිකාරම් 2023 දෙසැම්බර් 31 දක්වා පියවා නොමැති බැවින්, එම රු.162,084 ක් වූ මුළු ශේෂය හඳුනාගෙන බොල්ණය හා අඩමාණ ණය වෙන්කර ඇති අතර, අත්තිකාරම් ශේෂය සඳහා පොදු වෙන්කිරීමක් සිදු කර නොමැත. සැසඳුම් කොට අදාල වෙනස්කම් හඳුනා ගැනීමට කටයුතු කරන බවත්, ඒ අනුව අදාල ගැලපුම් නිවැරදි කිරීමට ඉදිරියේදී කටයුතු කරන බවත්, දන්වා සිටිමි. | අත්තිකාරම් සම්පූර්ණ වටිනාකම් ගිණුම් වල ඇතුළත් කළ යුතු වීම. |
| (ආ) | කළමනාකරණය විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භෞතික තොග ආගණනයක් සිදු කල යුතු වුවත්, ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වර්ෂය අවසානයේ තොග භෞතිකව ආගණනය සිදු කර නොතිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් රු.191,595,374 ක් වටිනා අවසාන තොගයේ විශ්වාසනීයත්වය හා නිරවද්‍යතාවය තහවුරු කරගැනීමට නොහැකි විය. | 2023 වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්ථාව 2024.04.03 දින වන විට සකස්කර ආරක්ෂක අමාත්‍යාංශය වෙත භාරදී තිබූ අතර, අදාළ මණ්ඩලයේ නිරීක්ෂණ අනුව පාවිච්චියට නුසුදුසු භාණ්ඩ තක්සේරු කිරීම සඳහා ද පත්කරන ලද අයෝග්‍ය කිරීම් මණ්ඩල කටයුතු ද අවසන් අදියරේ සිදුකරමින් පවතී. | තොග වටිනාකම් විශ්වාසදායී ලෙස තහවුරු කර ගැනීමට තොග ආගණනයක් කළ යුතු වීම. |
| (ඇ) | ශ්‍රවනාගාරය ඉදිකිරීම සඳහා 2010 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වැය කළ රු.96,953,827 ක මුදලක් කෙරීගෙන යන වැඩ තුළ ඇතුලත් කර නොතිබූ අතර විශ්වවිද්‍යාලීය රෝහලේ Budget Hotel Hospital නමැති ඒකකයේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රු.11,506,604 ක් වැය කර තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන් තුළ කෙරීගෙන යන වැඩ ලෙස රු.10,237,786 ක් පමණක් දක්වා තිබීමෙන් කෙරීගෙන යන වැඩ වල | 2010 වර්ෂයේ සිට 2023.12.31 දක්වා ශ්‍රවණාගාර ගොඩනැගිල්ල සඳහා දරන ලද සියළු වියදම් ගිණුම් ගත කර ඇති බැවින් විගණන විමසුමෙහි දක්වා ඇති පරිදි ශ්‍රවණාගාරයේ වියදම රු.96,953,827 ක මුදලක් අඩුවෙන් දක්වා ඇත | කෙරීගෙන යන වැඩ තුළ සියළු වියදම් ඇතුළත් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | මුළු වටිනාකම රු.98,222,645 කින් අඩුවෙන් දක්වා තිබුණි. | යන නිරීක්ෂණය පදනම් විරහිත ගිණුම්කරණයේදී කිසිසේත් පිළිගත් නොහැක්කක් බැවින් එකී නිරීක්ෂණය ඉවත් කර ගන්නා මෙන් ඉල්ලමි. Budget Hotel Hospital නමැති ඒකකය සඳහා සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන වියදමක් වාර්තා වී නොමැති අතර, ව්‍යාපෘති කාර්යාලය වෙතින් අදාල විස්තර ලබා ගැනීමෙන් පසු යම් වෙනසක් ඇතොත් අදාල ගැලපීම් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | |
| (ඇ) | පුද්ගලික සැත්කම්වලට අදාළව 2023 ජනවාරි 01 දින පැවති රු.2,187,341 ක ලැබිය යුතු ආදායම සමාලෝචිත වර්ෂය තුළදී අය වී තිබුණ ද, අදාළ ශේෂය තව දුරටත් ලැබිය යුතු ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ලැබිය යුතු ආදායම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේදී මෙම ලැබිය යුතු ලැබීම් ලැබී ඇති අතර, එබැවින් මෙය මූල්‍ය වාර්තා තුල ඉදිරියේදී නිවැරදි කරනු ලබයි. | ලැබිය යුතු ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම. |
| (ඉ) | 2023 දෙසැම්බර් 31 දිනට පැවති රු.70,931,247 ක වෛද්‍ය සැපයුම් තොගය තුල ඇතුලත් රු.11,349,293 ක කල් ඉකුත් තොග වලට අදාලව වෙන් කිරීම් ගිණුම් වල සලසා නොතිබූ අතර අදාළ ඖෂධ ඉවත් කිරීමට කළමනාකරණය විගණිත දින වන විටත් කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් එම වටිනාකමින් ගිණුම් තුළ තොගය වැඩියෙන් දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ ඌණතාවය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | කල් ඉකුත් වූ හා තත්ත්ව සහතිකයන්ගෙන් අසමත් වූ ඖෂධ ඉවත් කිරීමට මණ්ඩලයක් පත් කර එම මණ්ඩල වාර්තාව ජාතික ඖෂධ නියාමන අධිකාරිය හා ඖෂධ සැපයුම් අංශය වෙත ඉදිරිපත් කර ඇත. මෙම ඖෂධ ඉවත් කිරිම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ජාතික ඖෂධ නියාමන අධිකාරිය හා ඖෂධ සැපයුම් අංශය වෙතින් ලැබිය යුතුව ඇත. | නිවැරදි තොග වටිනාකම් ගිණුම් වල දැක්විය යුතු වීම. |

### 1.5.3 නොසැඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| පර්යේෂණ ප්‍රදාන | (38,678,752) | 25,322,871 | 64,001,623 | විගණන විමසුම හා එකඟ වෙමි. | මූල්‍ය ප්‍රකාශන ශේෂයන් අනුරූපී |

| | | |
|---|---|---|
| | නිවැරදි කිරීමට කටයුතු කෙරේ. | වාර්තා සමඟ ගැලපිය යුතු වීම. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙළෙඳ ණයගැතියන් තුල වර්ෂයකට වඩා පැරණි අය නොවූ ණයගැති වටිනාකම රු. 359,796,230 ක් වූ අතර එම ශේෂ සඳහා ණයගැති කාල විශ්ලේෂණයක් පිළියෙල කර නොතිබුණි. තවද සිසුන්ගෙන් ලැබී තිබූ රු. 70,650,682 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද නිරවුල් කර නොතිබූ අතර එම ශේෂ තුළ වර්ෂයකට වඩා පැරණි ශේෂ වටිනාකම රු. 40,275,433 ක් විය. | Sage 300 පරිගණක මෘදුකාංගය මගින් ණයගැති කාල විශ්ලේෂණය ලබා ගත හැක්කේ වර්ථමාන, දින 1-30, දින 31-60, දින 61-364, දින 365ට වැඩි පරිදි ය. නමුත්, ණයගැති කාල විශ්ලේෂණයෙහි සවිස්තරාත්මක වර්තාවෙහි ඉන්වොයිසි දිනය ලබා ගත හැකි ය. | ණයගැති ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර ණයගැති ශේෂ සඳහා කාල විශලේෂණ පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | වර්ෂ 1 සිට 25 දක්වා පැරණි රු.99,028,325 ක් වූ අයවිය යුතු බැඳුම්කර, වර්ෂ 6 ක් පැරණි රු.15,439,662 ක් වූ ලැබිය යුතු සලාක දීමනාව සහ වර්ෂ 1 ත් 9 ත් දක්වා පැරණි රු.6,219,490 ක් වූ ලොන්ඩ්‍රි ආදායම සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | නඩු පැවරීමට කටයුතු කර ඇත. | අහිමිව ඇති ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 12.2.5 වගන්තිය | පුරප්පාඩු වී තිබෙන තනතුරක රාජකාරි ආවරණය කිරීමට යොදා ඇති දෙපාර්තමේන්තුමය වැඩ පිළිවෙලක් යටතේ එම රාජකාරි ආවරණය කරන නිලධරයෙකුට වැඩබැලීමේ වැටුපක් නොහොත් කිසිඳු අතිරේක පාරිශ්‍රමිකයක් ලබාගැනීමට නොහැකි නමුත් 2022 ජුනි මස පැවැති මෙම විශ්වවිද්‍යාලයේ 644 වන කළමනාකරණ මණ්ඩල අනුමැතිය මත විශ්වවිද්‍යාලයේ මූල්‍යාධිකාරී, මීලෝදා ආයතනයේ ගණකාධිකාරී තනතුරේ රාජකාරි ආවරණය කිරීම සඳහා 2022 ජුලි මස 01 වන දින පත්කර තිබුණි. 2022 | ස්ථාවර සහකාර මූල්‍යාධිකාරීවරයෙකු පත් කෙරෙන තෙක් විශ්වවිද්‍යාලයේ සුදුසුකම් සහ අත්දැකීම් පරිපූර්ණ මූල්‍යාධිකාරී නිලධාරීතුමා මෙට්‍රොපොලිටන් කැම්පස් අධ්‍යයන ආයතනයේ ගණකාධිකාරී තනතුරේ වැඩ බැලීම සඳහා කළමනාකරණ මණ්ඩල අනුමැතිය ඇතිව පත් කර ඇත. මූලික වැටුපෙන් 25% දීමනාවක් ගෙවීමටද අනුමත විය. | ආයතන සංග්‍රහයට අනුකූල විය යුතු වීම. |

සැප්තැම්බර් 13 දින සිට මෙට්‍රොපොලිටන් කැම්පස් අධ්‍යයන ආයතනය සඳහා සහකාර මූල්‍යාධිකාරීවරයෙකු පත්කර තිබියදී 2022 ඔක්තෝබර් සිට 2023 ඔක්තෝබර් දක්වා රාජකාරී ආවරණය සඳහා දීමනා ලෙස ගෙවා තිබූ මුදල රු.452,238 ක් විය.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | | | | |
|---|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 371(2)(අ) | කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා තත්කාර්යය අතුරු අග්‍රිමයක් ලබාදිය හැකි වුවද, විශ්වවිද්‍යාලය විසින් සමාලෝචිත වර්ෂය තුල අවස්ථා 57 කදී එම සීමාව ඉක්මවා එකතුව රු.15,941,748 ක අත්තිකාරම් ලබාදීමට කටයුතු කර තිබුණි. | මාසයක් පමණ එකදිගට සිදුවන විභාග වලට ආවේණික වියදම් එකී විභාග පවතින අවස්ථාවලදීම දැරීමට සිදුවේ. අත්‍යාවශ්‍ය වියදම් දැරීමට ඒ සඳහා පෙර සැළසුම් කල හා අනුමත කල අයවැයකට අනුව රු.100,000 වඩා වැඩි වටිනාකමකින් යුත් අතුරු අග්‍රිමයන් ලබා දීම සිදු වේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාළ සීමාවන්ට යටත්ව තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දීමට කටයුතු කළ යුතු වීම. |
| (ii) | මුදල් රෙගුලාසි 371(6) | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එහි වාර්තාව ජුනි 15 ට පෙර විගණකාධිපති වෙත යොමු කල යුතු වුවත් 2023 වර්ෂයේ විශ්වවිද්‍යාලයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව එදිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ වාර්ථාව 2024.04.03 දින අමාත්‍යාංශය වෙත භාරදී ඇත. අයෝග්‍ය කිරීම් මණ්ඩල කටයුතු ද අවසන් අදියරේ පවතින බැවින් කඩිනමින් අදාළ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කෙරේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නියමිත දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (iii) | මුදල් රෙගුලාසි 880 හා 891 | ආයතනයේ ඇප තැන්පතු තැබිය යුතු නිලධාරීන් හඳුනාගෙන ඇප තැන්පතු ලේඛනයක් තබාගත යුතු වුවත් ආයතනය විසින් ඇප තැන්පතු ලේඛනයක් පවත්වාගෙන නොමැති බව විගණනයට නිරීක්ෂණය විය. | සරප්-කොඅවි ගෙන් රු.5,000 ක ඇප මුදලක් ලබා ගෙන ඇති අතර, එම වටිනාකම නැවත ගෙවිය යුතු වටිනාකමක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධන) පනතේ 8 එ (1) වගන්තිය | වෙනත් යම් නීතියක විධිවිධාන කෙසේ වුව ද යම් සංවර්ධන ප්‍රදේශයක හෝ එහි කොටසක යම් සංවර්ධන කටයුතු කරගෙන යාම හෝ සංවර්ධන කටයුතුවල නිරතවීම, ආණ්ඩුවේ නියෝජ්‍යායතනයක් ඇතුළු කිසිම තැනැත්තකු විසින්, අධිකාරිය විසින් එහි ලා නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය යටතේ හැර සිදු කරනු නොලැබිය යුතු වුවත්, ආයතනය විසින් ශ්‍රවණාගාර ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාලව අනුමැතිය ලබාගෙන නොතිබුණි. | විශ්වවිද්‍යාලයේ වෛද්‍ය ශිෂ්‍ය නිලධාරින් සඳහා වෛද්‍ය පීඨයක් ඉදිකිරීමට 2010 වර්ෂයේ කැබිනට් අනුමැතිය ලැබී ඇත. එම වෛද්‍ය පීඨයට අනියුක්තව ශ්‍රවණාගාරයක් ඉදිකිරීමට ඇත. එබැවින්, ඉදිකිරීම් කටයුතු කරමින් පවතිනු ලබන්නේ එම ශ්‍රවණාගාර ගොඩනැගිල්ලය. | පනත ප්‍රකාරව අවසර පත්‍රය ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | 2021 වර්ෂයේ රාජ්‍ය ව්‍යවසායන් සඳහා නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොතෙහි 7 වන පරිච්ඡේදයේ 7.1 සිට 7.6 දක්වා වගන්ති | මූලික කාර්යසාධන දර්ශක පදනම් කර ගෙන ක්‍රියාකාරි සැලැස්මෙහි සත්‍ය කාර්යසාධනයක් කාලීනව සිදුකර වාර්ෂිකව කාර්යසාධන වාර්තාවක් පිළියෙල කළ යුතු නමුත් විශ්වවිද්‍යාලය විසින් එවන් කාර්යසාධන වාර්තාවක් පිළියෙල කර ඇති බව තහවුරු නොවුණි. | කාර්යසාධන වාර්තාවක් සකස්කර ඇත. පිටපත් මේ සමග ඉදිරිපත් කර ඇත. | මෙහෙයුම් අත්පොත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.4,694,782,267 ක ඌණතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 176,289,055 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 4,871,071,322 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට රජයේ පුනරාවර්තන දායකය රු.1,974,334,000 කින් හා පොලී ආදායම රු.451,438,501 කින් අඩුවීම හා විදුලි වියදම රු.342,810,087 කින් ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

(අ) සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම ඉකුත් වසරට සාපේක්ෂව සියයට 11.67 කින් එනම් රු. 1,342,272,233 කින් පහළ ගොස් තිබූ අතර ඒ සඳහා විදේශ ව්‍යවහාර මුදලින් පවත්වාගෙන ගොස් තිබූ ස්ථාවර තැන්පතු වසා දැමීම හේතුවෙන් පොලී ආදායම අඩු වීම හේතු වී තිබුණි. එහෙත් ඉකුත් වර්ෂයට සාපේක්ෂව රෝහල් ආදායම සියයට 34 කින් සහ පාඨමාලා ආදායම සියයට 7 කින් වර්ධනය වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මුළු වියදම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 23 කින් එනම් රු. 1,601,268,444 කින් ඉහළ ගොස් තිබූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සැපයුම් වියදම් සහ ගිවිසුම්ගත සේවා වියදම් ඉහළ යාම මෙයට හේතු වී තිබූ අතර පිළිවෙලින් එම වැඩිවීම සියයට 76 ක් සහ 60 ක් විය. සැපයුම් වියදම් අතුරින් ලිපිද්‍රව්‍ය වියදම් සියයට 182 කින් එනම් රු.76,189,029 කින්, ඉන්ධන සහ ලිහිසි තෙල් වියදම් සියයට 83 කින් එනම් රු.106,526,588 කින් හා නිල ඇඳුම් සහ රෙදි පිළි වියදම් සියයට 115 කින් එනම් රු. 25,503,667කින් සහ ගිවිසුම්ගත සේවා වියදම් අතුරින් විදුලි වියදම් සියයට 82 කින් එනම් රු.342,810,087 කින්, අන්තර්ජාල වියදම සියයට 187 කින් එනම් රු.30,447,215 කින්, නිල

සංග්‍රහ වියදම් සියයට 65 කින් එනම් රු. 19,731,693 කින් හා වැඩමුළු වියදම් සියයට 243 කින් එනම් රු. 4,520,193 කින් වැඩි වී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

(අ) ඉකුත් වර්ෂයේ සියයට 0.66 ක් වූ ස්කන්ධය මත ප්‍රතිලාභ අනුපාතය සමාලෝචිත වර්ෂයේදී සියයට (-10.99) ක් දක්වා අඩු වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ 2.7:1 ක් වූ ජංගම අනුපාතය සමාලෝචිත වර්ෂයේදී 0.93:1 ක් දක්වා පිරිහී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේදී ස්කන්ධය මත ණය අනුපාතය 0.76:1 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එය 0.72:1 ක් දක්වා සුළු අඩු වීමක් සිදු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දී රෝහලේ විදුලි බිල්පත් නියමිත දිනයේ දී ගෙවීමට කළමනාකරණය කටයුතු නොකිරීම හේතුවෙන් බිල්පත් පියවීමේ ප්‍රමාද ගාස්තු ලෙස රු.12,128,284 ක දඩ මුදල් ගෙවීමට සිදු වී තිබුණි. | විදුලි බිල් මත අධිභාරයක් ගෙවීමට සිදුවූයේ මහ භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කරන ලද ද්‍රවශීල මුදල් නියමිත කාලයට නොලැබීම වැනි හේතූන් මත වන අතර, විදුලි බිල දෙගුණයකින් පමණ වැඩි වීමත් අධිභාර අයකිරීම් ප්‍රතිශතය 0.75% සිට 1.5% දක්වා වැඩි කිරීම ද ඉහත කී අධිභාරයන් ඇති වීමට හේතු වේ. | විදුලි බිල්පත් අප්‍රමාදව පියවීම මඟින් ආයතනයට සිදු වන පාඩු අවම කර ගත යුතු වීම. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දක්ෂිණ මණ්ඩපයේ කැඩෙට් නිලධාරීන් 41 ක් ඇතුලු සම්පූර්ණ සිසුන් 761 ක ගේ සහ පරිපාලන, අධ්‍යනය හා නේවාසික කටයුතු සඳහා විදුලි වියදම් ලෙස රු.56,072,219 ක් සමාලෝචිත වර්ෂය තුලදී දරා තිබූ අතර එය අවම කර ගැනීමට හෝ පාලනයකර ගැනීම සඳහා මෙම ප්‍රදේශයට උචිත විකල්ප බලශක්ති ක්‍රමවේදයකට යොමු වී නොමැති බව නිරීක්ෂණය විය. | දක්ෂිණ මණ්ඩපයේ ස්ථානීය විභවය උපයෝජනය කිරීමෙන් මෙකී සූර්ය බල ව්‍යාපෘතිය මගින් 3MW පමණ ධාරිතාවයකින් යුත් විදුලියක් උත්පාදනය කිරීමට හැකියාවක් පවතින අතර, එම ධාරිතාවය ජාතික විදුලි බල පද්ධතියට සම්ප්‍රේෂණය කිරීමට ද හැකියාවක් පවතී. මෙකී සූර්ය බලශක්ති ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනයක් ද සිදුකර කර ඇති අතර, මේ වනවිට සුදුසු ආයෝජකයෙක් සෙවීමට කටයුතු කෙරෙමින් පවතී. | විදුලි වියදම් පාලනය කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 2023 ජනවාරි මස සිට මෙට්‍රොපොලිටන් කැම්පස් අධ්‍යයන ආයතනයෙහි පළමු මහල ලෝක ආහාර වැඩසටහනෙහි සහයෝගිතා | ඔබගේ නිරීක්ෂණය සමග එකග වෙමි. පලමු මහල භාවිතා කරන ලෝක ආහාර ව්‍යාපෘති කාර්යාලය (ජනාධිපති කාර්යාලය) සමග ගිවිසුම් ගත වීමට අවශ්‍ය ඉදිරිකටයුතු සැලසුම් කරමින් පවතී. | කඩිනමින් විධිමත් හා සාධාරණ කොන්දේසි සහිතව ගිවිසුම් ගත වීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ලේකම් කාර්යාලය සඳහා ලබාදී තිබුණි. මේ සඳහා කිසිදු කුලී ආදායමක් ලැබී නොතිබුණු අතර, එම පරිශ්‍රයට අදාළ විදුලිය, ජලය, වරිපනම්, ආරක්ෂිත, සනීපාරක්ෂක යනාදී පොදු කාර්ය වියදම් ආයතන දෙක අතර අනුපාතිකව බෙදාහැරීමට අදාළව ලිඛිත ගිවිසුමකට ද එළඹී නොතිබුණි. | | |
| (ඇ) | 2021 අප්‍රේල් 20 දිනැති අංක අමප/21/0584/303/052 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් මිලෝදා මූල්‍ය අධ්‍යයන ආයතනය විශ්වවිද්‍යාලයට පැවරීමේදී සුදුසු සේවක සංඛ්‍යාව තීරණය කිරීමට හා එකී සේවක සංඛ්‍යාව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබූ නමුත් 2023 ඔක්තෝබර් 10 දින වන විටත් එම අනුමැතිය ලබාගෙන නොතිබුණි. | 2022 මැයි මස 26 වන දින මෙම විශ්වවිද්‍යාලීය ලිපිය හරහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී. ඉල්ලුම්කරන ලද කාර්යය මණ්ඩලය සඳහා ස්ථිර පදනම මත අනුමැතිය ලබා ගැනීමට 2023 ඔක්තෝබර් 23 වන දිනැති ලිපියෙන් නැවත වතාවක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉල්ලීමක් කර ඇත. | කඩිනමින් සේවක සංඛ්‍යාව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | විශ්වවිද්‍යාලයේ අනුමත කාර්ය මණ්ඩලය අනුව 103 දෙනෙකු කළමනාකරණ සහකාර තනතුර සඳහා බඳවා ගත යුතු වුවත්, වැඩ බලන ලේඛකාධිකාරි විසින් අංක කොආවි/පා/පොදු/36 හා 2024 ජුනි 18 දිනැති ලිපිය මගින් ලබාදී තිබූ තොරතුරු අනුව කළමනාකරණ සහකාර සඳහා ස්ථිර සේවයේ 101 දෙනෙකු හා කොන්ත්‍රාත් පදනම මත 38 දෙනෙකු බඳවා ගෙන තිබූ අතර, මෙලෙස 139 දෙනෙකු බඳවා ගැනීම හේතුවෙන් 36 දෙනෙකු අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා බඳවා ගෙන තිබුණි. | අංක 04/2019 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව, අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ සහායක කාර්ය මණ්ඩලය අතර අනුපාතය අවම වශයෙන් 1:2 හෝ 1:1 අතර පවත්වාගත යුතු විය. වර්ධනයට සමගාමීව ආරක්ෂක විශ්වවිද්‍යාලයක් ලෙසත් වරින්වර නිකුත්කරනු ලබන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයන්ට අනුකූල විය යුතු නිසාත් නව අංශ/ ආයතන වරින්වර ඇතිකිරීමට සිදුවිය. එම අංශ සඳහා අවශ්‍ය අවම කාර්යමණ්ඩලය පවත්වාගෙන යාම සඳහා තාවකාලික පදනම මත බඳවා ගැනීම් සිදුකරන ලදී. | සියළු බඳවා ගැනීම් අනුමත කාර්ය මණ්ඩලයට අනුව සිදු කළ යුතු වීම. |
| (ඉ) | කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් | මහා භාණ්ඩාගාරය යටතේ පිහිටුවන ලද අක්‍රිය තත්ත්වයේ පවතින සීමාසහිත ප්‍රොවිඩන්ට් ප්‍රොපර්ටි ලංකා සමාගම සතු | කඩිනමින් ඉඩම පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | හෙක්ටයාර් 21.5815 ක භූමියේ විශ්වවිද්‍යාලයීය ශික්ෂණ රෝහල ස්ථාපිතකර තිබුණි. එම භූමියෙහි ඉදිකර තිබුණු ශික්ෂණ රෝහලට අයත් ගොඩනැගිලිවල වටිනාකම රු.45,385,484,229 ක් වූ අතර, භූමිය සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.1,216,884,293 ක පිරිවැයක්ද දරා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන්වන විට ඉදිකිරීම් අවසන්කර වර්ෂ 07 කට අධික කාලයක් ගතවී ඇතත් අදාල ඉඩම පවරාගැනීම අවසන්ව නොතිබුණි. | එම ඉඩම් කොටස් මහා භාණ්ඩාගාරය වෙතින් ලබා දෙනු ලබන තීරණය පරිදි ඉඩම් අමාත්‍යාංශය වෙතින් භුක්තිකරුවන් වෙත පවරාදීමේ ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතව ඇත. | |
| (ඊ) | 1988 අංක 27 හා 2007 අංක 50 දරන පනත් මගින් සංශෝධිත 1981 අංක 68 දරණ ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතන පනත ප්‍රකාරව 2011 වර්ෂයේ සිට කැඩෙට් නිළධරයන් හෝ රජයේ නිළධරයන් නොවන දේශීය හා විදේශිය සිසුන් වෙත මුදල් ගෙවීමේ පදනම මත උපාධි පිරිනැමීම ආරම්භකර තිබුණි. තවද, 2018 මාර්තු 21 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී ශිෂ්‍යයන් බඳවාගැනිම සහ පාලක මණ්ඩලයේ තීරණ වලංගුතාවය යන කරුණු ආවරණය වන ලෙස විශ්වවිද්‍යාලයට ගැලපෙන ලෙස අදාල පනත සංශෝධනය කරගන්නා ලෙස දැනුම් දී තිබුණද සමාලෝචිත වර්ෂය තුලදී ද පනත සංශෝධන කාර්යය අවසන්කර නොතිබුණි. | නීති කෙටුම්පත් සම්පාදක විසින් අවසන් කෙටුම්පත 2024.06.25 දින මෙම විශ්වවිද්‍යාලයට පිටපත් සහිතව ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. උක්ත අවසන් කෙටුම්පත සඳහා නීතිපති වෙතින් ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ සහතිකය ලබා ගැනීමට කටයුතු කරන ලෙස ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් 2024.06.27 දින ඉල්ලීම් කරන ලදී. | කඩිනමින් පනත සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (උ) | 2018, 2019 සහ 2020 වර්ෂයන්වලදී Pneumatic Tourniquet Pump System, Traumatology Instrument, PMGS Accessories සහ Endoscopy For Medicine යන මිලදී ගැනීම් වෙනුවෙන් | KDU/PRO/CAP/1353/2017 අයිතමයන් විශ්වවිද්‍යාල රෝහල වෙත ලැබී ඇති අතර, ඒවා ලෙජර්ගත කර ඇති නමුත් තත්ත්ව පරීක්ෂණයෙන් අසමත් වී ඇත. මේ පිළිබඳ සැපයුම්කරු මීට පෙරද දැනුවත් කර ඇති නමුත්, සැපයුම්කරු විසින් මේ සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් මේ වන තෙක් සිදුකර | කඩිනමින් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | රු.48,834,173 ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබූ අතර ඒ අනුව මිලදී ගත් වත්කම් තත්ත්ව පරීක්ෂා වලින් අසමත් වී තිබීම හේතුවෙන් ගිණුම් තුළ නිරවුල් නොවී පැවති අතර වර්ෂ 3 ත් 5 ත් අතර කාලයක් ගත වී තිබුණ ද එම පාඩුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නොමැත. එමනිසා මෙම අයිතම ගෙවීම් කටයුතු කිරීම සඳහා ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. | |
| (ඖ) | විශ්වවිද්‍යාලය, රෝහල සහ දක්ෂිණ මණ්ඩපයේ 2015 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ගැණුම් අත්තිකාරම් හා මුදල් අත්තිකාරම් පිළිවෙලින් රු.361,404,619 ක් හා රු.4,897,892 ක් 2023 දෙසැම්බර් 31 දින වන විට ද පියවීමට කටයුතු කර නොතිබුණි. තවද, දක්ෂිණ මණ්ඩපයේ 2023 වර්ෂයේ ජනවාරි මස සිට සැප්තැම්බර් 22 දක්වා අවස්ථා 22 කදී ලබාදී තිබූ එකතුව රු.895,000 ක් වූ අත්තිකාරම් දින 14 ත් දින 117 ත් අතර ප්‍රමාදයකින් යුක්තව පියවා තිබුණි. | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් විසින් ලබා ගත් මෙම අත්තිකාරම් ඔවුන්ගේ කාර්යය බහුලත්වය සහ බිල්පත් හා භාණ්ඩ මිලදී ගැනීම් හා අදාල සේවාවන් ලබා ගැනීමේදී ප්‍රාදේශීයව බලපා ඇති දුෂ්කරතා හේතු කොටගෙන පියවීම ප්‍රමාද වී ඇත. තවද, අත්තිකාරම් ඉතිරි මුදල් බැංකුව වෙත තැම්පත් කිරීමේදී ඇතිවී තිබෙන ප්‍රායෝගික දුෂ්කරතාද අත්තිකාරම් ප්‍රමාද වී පියවීමට බලපා ඇත. තවදුරටත් නිරවුල් කර ගත යුතුව ඇති අත්තිකාරම් නිරවුල් නොකරන අයවලුන් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. | කඩිනමින් අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මෙට්‍රොපොලිටන් කැම්පස්හි 2023 වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා පාඨමාලා 56 ක් සැලසුම් කර තිබූ නමුත් ඉන් පාඨමාලාව 12 ක් පමණක් පවත්වා තිබූ අතර, ඉල්ලුමක් නොතිබීම මත පාඨමාලා 44 ක් පවත්වා නොතිබුණි. පවත්වා තිබූ පාඨමාලා 12 අතුරින් පාඨමාලා 11 ක් සඳහා සැලසුම් කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාවක් සහභාගි වී නොතිබූ අතර එය සියයට 20 ත් සියයට 50 ත් අතර පරාසයක විය. | ආර්ථික අර්බුධකාරී වාතාවරණය මත රාජ්‍ය ආයතනයන් හි සේවකයන් පුහුණු කිරීමේ වැඩසටහන් සඳහා සහභාගීවීමේ ප්‍රවණතාවය පහල ගොස් ඇත. ඉදිරියේදී සම්පත් උපරිම කාර්යක්‍ෂමව උපයෝජනය කිරීමට කටයුතු කෙරේ. | ඉල්ලුමක් පවතින නව පාඨමාලා ඇතුලත් කළ යුතු වීම. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දක්ෂිණ මණ්ඩපය සහ විශ්වවිද්‍යාල රෝහල විසින් මිලදී ගෙන තිබූ විවිධ අයිතම 57 කට අයත් තොග ඒකක 443,695 ක් 2018 වර්ෂයේ සිට නිශ්කාර්යව පැවති අතර ඉන් වටිනාකම රු.79,612,689 වූ තොග අයිතමයන් තුල රෝහල සඳහා මිලදී ගෙන තිබූ වගකීම් කාලය ඉක්ම වූ වෛද්‍ය උපකරණ වටිනාකම රු.76,825,839 ක් විය. | කම්බි තොගය නුදුරේදී ඉදිවීමට නියමිත නව ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා භාවිතා කිරීමට ගබඩාකොට ඇත. කොටන් ෆයිල් ලේස් අතිරික්ත තොගයක්ව පැවතීම හේතුවෙන් කොආවි රත්මලාන වෙතින් උපදෙස් ඉල්ලා සිටින ලදී. වෛද්‍ය උපකරණ රෝගීන්ගේ ප්‍රයෝජනය සඳහා ඉදිරියේදී අවශ්‍යතාවයන් මත නිකුත් කිරීම සිදු කරයි. | සපයා ගනු ලබන වෛද්‍ය උපකරණ ඵලදායී ලෙස උපයෝජනය කළ යුතු වීම. |
| (ආ) | මෙට්‍රොපොලිටන් කැම්පස් අධ්‍යයන ආයතනයෙහි ගොඩනැගිල්ල වර්ග අඩි 11,074 බැගින් වූ මහල් 05 කින් හා වර්ග අඩි 10,104 වූ 6 වන මහලකින් සමන්විත වූ අතර, මෙම මහල් තුළ ආසන ධාරිතාව 875 ක් වූ දේශන සඳහා භාවිතා කළ හැකි ශාලා 7 ක් පැවති නමුත් මෙම ශාලා වැඩි කාලපරිච්ඡේදයක් ඌණ උපයෝජිතව පැවති බව නිරීක්ෂණය විය. | ආයතනයේ පවතින වත්කම් උපයෝජනය අවමවීමට හේතු වී ඇත්තේ පාඨමාලාවන් සඳහා රාජ්‍ය සේවකයන් සහභාගී වීමේ ප්‍රවණතාවය අවම බැවින් මේ වන විට මෙම ආයතනයේ ඇති වත්කම් පුද්ගලික අංශය වෙත ලබාදීමෙන් අදායම් උපයයි. තවද අප ආයතනයේ සියලුම මහල් වල පවත්නා පහසුකම් වෙබ් අඩවිය, මුහුණු පොත, අත් පත්‍රිකා, අත් පොත වැනි අලෙවිකරණ මාර්ග ඔස්සේ ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරනු ලැබේ. | දේශන ශාලා පූර්ණ වශයෙන් උපයෝජනය කිරීමට කටයුතු කළයුතු වීම. |
| (ඇ) | 2018 වර්ෂයේදී විශ්වවිද්‍යාල රෝහලේ රසායනාගාර පරීක්ෂණ ද්‍රව්‍යයන් හා වාර්තාවන් ප්‍රවාහනය කිරීමේ අරමුණින් රු.96,846,900 (ඇ.ඩො.530,000) ක් වැය කර අංශ (Stations) 56 ක් සම්බන්ධ කරමින් වායු නල පද්ධතියක් ස්ථාපනය කර තිබූ අතර, ඉන් අංශ 52 ක් සඳහා පමණක් සමාලෝචිත වර්ෂයේ ගමන්වාර සිදු කර තිබුණි. ඉන් ගමන්වාර 100 කට | විශ්වවිද්‍යාල රෝහලේහි වායුනල පද්ධතියේ අංශ 56ක් ස්ථාපිතකර ඇති අතර රෝහල පූර්ණ ධාරිතාවයකින් ක්‍රියාත්මක නොවීම නිසා ඇතැම් ස්ථානවල ඇති අංශ භාවිතා නොකිරීම වායුනල පද්ධතියේ ඌණ උපයෝජනයට හේතු වේ. තවද, 2022 වර්ෂයේ පද්ධතිය හරහා ගමන්වාර 66004ක් කර ඇති අතර 2023 වර්ෂය සඳහා ගමන්වර 70217 ක් සිදුකර ඇත. | වායු නළ පද්ධතිය උපරිම ධාරිතාවයෙන් රෝහල් කටයුතු සඳහා භාවිතයට ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | වඩා අඩුවෙන් සිදුකර කර තිබූ අංශ 25 ක් පැවති අතර ඒ අනුව ඌණ උපයෝජිත අංශ ප්‍රමාණය සියයට 44 ක් විය. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසන් වන විටද රෝහලේ වාට්ටු අංක 5A, 7A හා 7B සහ දැඩි සත්කාර ඒකක 02, 03 හා 04 යන අංශ 2022 මැයි මස සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා උපයෝජනයෙන් තොරව පැවති අතර, ඒ තුල පැවති රු.210,190,808 ක් වටිනා වෛද්‍ය උපකරණද නිශ්කාර්යව පැවතුණි. | වාට්ටු අංක 7-A දෙවන වෛද්‍ය වාට්ටුව ලෙස විවෘත කිරිමට සැසලසුම් කර ඇති අතර, වාට්ටු අංක 07- B පෞද්ගලික අංශයේ වාට්ටුවක් වේ. එය වාට්ටු අංක 09-B සහ 09- A පෞද්ගලික ධාරිතාවය ඉක්මවා ගිය විට රෝගීන් ඇතුළත් කිරීම සිදු කරන අතර දැනට පවතින දැඩි කාර්යය මණ්ඩල හිගය මනාව කළමනාකරණය කිරිමට අවශ්‍ය බැවින්, වාට්ටු අංක 08- B සහ 09-B උපරිමයෙන් භාවිතා කරනු ලැබේ. තවද, දැඩිසත්කාර ඒකක 02 දැනට ආරම්භ කිරිමට පවතින හෘද උරස් ඒකකය සඳහා භාවිතා කිරිමට පවතින අතර, එම ඒකකය ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සපුරා ගැනීමෙන් අනතුරුව දැඩිසත්කාර ඒකක 02 සඳහා එම උපකරණයන් ලබා දිමට කටයුතු කරමි. | වාට්ටු පූර්ණ ධාරිතායෙන් භාවිතා කිරිමට උපායමාර්ග සැකසිය යුතු වීම. |

### 3.5 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 පෙබරවාරි 24 දිනට නිම කිරිමට නියමිතව තිබූ රෝහලේ කළමනාකරණ තොරතුරු පද්ධතිය සඳහා 2023 දෙසැම්බර් 31 දිනට රු.215,240,527 ක් වැය කර තිබුණි. එය අවස්ථා 2 කදී කාලය දීර්ග කිරීමෙන් පසු මෙම ව්‍යාපෘතිය 2024 මැයි 28 දින වන විට අවසන් කළ යුතුව පැවතිය ද 2024 ජුනි 11 දින වන විටත් මෙම ව්‍යාපෘතියෙහි ප්‍රගතිය සියයට 68.5 ක මට්ටමේ විය. | නිරීක්ෂිත කරුණ සමග එකඟ වේ. | සැලසුම් කල පරිදි පද්ධතිය ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 වගන්තිය ප්‍රකාරව විධිමත් ප්‍රතිග්‍රහනය ලිපියක් නිකුත් කළ වහාම රු.500,000 ඉක්මවන භාණ්ඩ හෝ සේවා කොන්ත්‍රාත් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු වුවත්, දක්ෂිණ මණ්ඩපයේ නියැදි විගණනයේදී රු.500,000 ක් ඉක්මවූ එකතු වටිනාකම රු.20,728,998 ක් වූ ප්‍රසම්පාදනයන් 27 ක ප්‍රසම්පාදන ලිපිගොනු තුල කොන්ත්‍රාත් ගිවිසුමක් ඇතුලත් නොවූ අතර ලංසු ලේඛනවලද ඒ සඳහා වගන්තියක් ඇතුලත් කර නොතිබුණි. | මෙය නිවැරදි කර ගනිමින් ප්‍රසම්පාදන මාරගෝපදේශ 8.9.1ට අදාලව, රු.500,000 ඉක්මවන " භාණ්ඩ හා සේවා" මිලදී ගැනීම් සඳහා, සුදුසුකම් ලද සැපයුම්කරුවන් සමග ගිවිසුම් ගත වීම් මේ වන විටත් සිදු කරමින් පවතී. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | දක්ෂිණ මණ්ඩපයේ ඉදිකෙරෙමින් පැවති මණ්ඩපාධිපති නිවස්නය හා කැඩෙට් නිලධාරී නිවස්නය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය අවස්ථා කිහිපයකදී මිලදී ගැනීමට කටයුතු කර තිබුණි. ඒ අනුව මණ්ඩපාධිපති නිවස්නය සඳහා අවශ්‍ය දැව වෙනුවෙන් රු.3,980,725 ක් හා කැඩෙට් නිලධාරී නිවස්නයට දඟර වානේ කම්බි මිලදී ගැනීම වෙනුවෙන් රු.6,222,018 ක් වැය කර තිබූ අතර මෙම මිලදී ගැනීම් පිළිවෙලින් අවස්ථා 07 කදී හා 08 කදී සිදුකර තිබුණි. තවද, කැඩෙට් නිලධාරී නිවස්නය සඳහා වටිනාකම රු.2,124,000 ක් වූ ඇඳන් 24 ක් අවස්ථා 03 කදී එකම සැපයුම්කරුවෙකුගෙන් මිලදී ගැනීම් යන අවස්ථාවලදී සමස්ථ මිලදී ගැනීම වෙනුවෙන් ලබා ගත හැකිව තිබූ මිල වාසිය අහිමි වී තිබුණි. | ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව විසින් සිදුකරන බහුතරයක් ප්‍රසම්පාදන, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.4 යටතේ (Shopping) සිදුකරනු ලබන බැව් දන්වා සිටින අතර, මෙම මිලදී ගැනීම් රත්මලාන පරිශ්‍රය මගින් සිදුකර ගැනීමේදී ගත වන කාල සීමාව වැඩි බැවින්, ව්‍යාපෘති වැඩ අවසන් කර විවෘත කිරිමට තිබූ කාලසීමාව තුල සිදු කර ගැනීමට නොහැකිවීම මත අදියරයන් යටතේ මිලදී ගැනීම් සිදුකරන ලදී. මෙම අයිතමයන් එකිනෙකට වෙනස් වූ අයිතමයන් බැවින්, මෙම ලිපිගොනු වල එකම අයිතමය නැවත ඉල්ලීමක් සිදු වී නොමැත. තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා අමතර වැය බරක් දැරීමට ද සිදු නොවිය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6 වගන්තිය ප්‍රකාරව පැහැදිලි පිරිවිතර පිළියෙල කල යුතු වුවත් එවැනි පිරිවිතර පිළියෙල නොකර මිල ගණන් ලබාගෙන දක්ෂිණ මණ්ඩපයේ කෘමි සතුන් මර්ධනය සඳහා රසායන ද්‍රව්‍ය සහ මෙට්‍රොපොලිටන් කැම්පස් ආයතනය සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය පද්ධතියක් (Audio Visual System) මිලදී ගැනීමේදී පිළිවෙලින් රු.907,280 ක් හා රු.934,000 ක් වැය වී තිබුණි. තවද, ශ්‍රව්‍ය දෘශ්‍ය පද්ධතිය මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 ප්‍රකාරව | කෘමි සතුන් මර්ධනයට අදාළව ලංසු කැඳවීමේදි වර්ග අඩි මත ලංසු කැඳවූ අතර, ලංසු කරුවන් ස්ථානීය පරීක්ෂාවක් සිදු කිරිමකින් තොරව වර්ග අඩි මත ලංසු කැඳවීමේ පත සම්පූර්ණ කර ඇත. මෙට්‍රොපොලිටන් කැම්පස් (ගරන්ටි) ලිමිටඩ් ආයතන කටයුතු සිදු කරගෙන යන අවධියේ දී සිදු කර අනුමත කරගෙන ඇති අතර, එම අනුමත කරගත් අයදුම්පත අනුව ලංසු ලේඛන පිලියෙල කර සැපයුම්කරුවන් වෙත ඉදිරිපත් කර | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ නොතිබුණි. | ඇත. | |
| (ඇ) | තාක්ෂණික පීඨය සඳහා ඩෙස්ක්ටොප් පරිගණක 03 ක් මිලදී ගැනීමේදී ඒ සඳහා සිව් වතාවක් මිල ගණන් කැඳවීමට සිදුව තිබුණි. මේ සඳහා වර්ෂ 1 ½ ක කාලයක් ගතවීම නිසා ප්‍රමාදයක් ඇතිව තිබූ අතර එම කාල ප්‍රමාදය නිසා ඒවායේ මිල ගණන් වෙනස් වීම මත රු.827,100 ක අධි ගෙවීමක් සිදුකර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 වගන්තිය අනුව ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල නොකිරීම මේ සඳහා හේතු වී තිබූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.3 වගන්ති ප්‍රකාරව අසාමාන්‍ය කාලයක් ගතවීම මත මිල ගණන් සැලකිල්ලට ගෙන මුළු පිරිවැය ඇස්තමේන්තුව යාවත්කාලීන කර නොතිබුණි. තවද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.10 ප්‍රකාරව ලංසු වලංගු කාලය උපරිම දින 49 ක් විය යුතු නමුත් ඒ සඳහා කාලය දින 120 ක් ලෙස සඳහන් කර තිබුණි. | එකග වේ. ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 4.2.2 ප්‍රකාරව ප්‍රසම්පාදන කාල සටහනක් සකස් කර නොමැති අතර, ඒ සම්බන්ධයෙන් ප්‍රසම්පාදනයට සම්බන්ධ වන සියලුම වගකිවයුතු අංශ දැනුවත් කර ඇත. ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 4.3.3 ප්‍රකාරව ඇස්තමේන්තු පිරිවැය යාවත්කාලීන කළ යුතුය. නමුත් මෙම ආයතනයේ ඇස්තමේන්තු වටිනාකම භාවිත කරනු ලබන්නේ මිලදීගැනීම් ක්‍රමවේදය තෝරා ගැනීම සඳහා පමණක් වේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඉ) | ශ්‍රවණාගාරය ඉදිකිරීම අදියර තුනකින් 2010, 2011, සහ 2012 වසරවලදී නිම කිරීමට ඇස්තමේන්තු කර තිබුණද, 2015 වසර දක්වාම මෙම ඉදිකිරීමේ කටයුතු නිම කර නොතිබුණි. 2015 වසරේ සිට 2019 වසර දක්වා වසර 04 ක කාලයක් තුල මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු නවතා දමා තිබූ අතර, ඒ හේතුවෙන් ගොඩනැගිල්ලට වී තිබූ හානිවීම් නැවත සකස් කිරීම සඳහා රු. 8,458,531ක මුදලක් වැය කර තිබුණි. තවද, මාස 14 ක් ඇතුලත එනම් 2021 අගෝස්තු 31 දින වන විට ඉතිරි වැඩ නිම කිරීමට ඇස්තමේන්තු කර තිබුණද, 2024 පෙබරවාරි වන විටත් වැඩ අවසන් කිරීමට විශ්වවිද්‍යාලයට නොහැකි වී තිබුණි. මෙහිදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 වගන්තියට පටහැනිව ශ්‍රවනාගාරය සඳහා රු.5,670,000 වටිනා ටෝර් ස්ටීල් මිලදී ගැනීමේ දී ලංසු සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි. එමෙන්ම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 වගන්තියට පටහැනිව | වර්තමාන උපදේශක ආයතනය විසින් ව්‍යුහාත්මක කොටස් වල ශක්තිය වැඩි කල යුතු බව පෙන්වා දී ඇත. පළමු අදියරේදී උපදේශක ආයතනය විසින් සැලසුම්පත් ලබා දී ඔවුන්ගේ අධීක්ෂණය යටතේ ඉදිකරන ලද කොන්ක්‍රීට් කොටස් වල ශක්තිය ප්‍රමාණවත් නොවන බැවින් ඒවා කඩා ඉවත් කර නැවත ඉදිකිරීම සිදුකර ඇත. රු.8,458,530.58 ක මුදල මුල් අදියරෙහි වැඩබිම තුළ ඉදිකිරීම් කටයුතු සිදුකරන ලද වෘත්තිකයින්ගේ ඉදිකිරීම් අධීක්ෂණය, සුපරීක්ෂණය හා ඉදිකිරීම්හි ගුණාත්මකභාවය දුර්වල මට්ටමක පැවතීම යන හේතුන් නිසාවෙන් සිදුව නොමැති බව හා ඒ සඳහා වෙනත් හේතුන්ද බලපා ඇති බව පෙන්වා දෙමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹීමකින් තොරව මෙම ගොඩනැගිල්ල වෙනුවෙන් අවස්ථා 9 කදී රු.25,345,980 ක් වටිනා ප්‍රසම්පාදනයන් සිදුකර තිබූ බව නියැදි විගණනයේ දී අනාවරණය විය. | | |
| (ඊ) | ප්‍රසම්පාදන අත්පොතේ 3 වන පරිච්ඡේදයට පටහැනිව රු.11,036,177ක් වටිනා SAGE ගිණුම්කරණ මෘදුකාංගය මිලදී ගැනීම සඳහා වෙළඳපොල මිල සැඳැහුම් ක්‍රමය භාවිතා කර තිබීමෙන් ජාත්‍යන්තර/ ජාතික තරඟකාරී ලංසුකරුවන්ගේ මිල ගණන් කැඳවීමකින් අත්කර ගතහැකිව තිබූ වාසි අහිමි වී තිබුණි. | SAGE ගිණුම්කරණ මෘදුකාංගය මිලදී ගැනිමේදී එවකට පැවති හදිසි අවශ්‍යතාවය මත සහ මෙම විශ්වවිද්‍යාලයේ මූල්‍යාධාරී කාර්යාලයේ ගිණුම් අංශයේ වැටුප් සැකසීම සහ අනෙකුත් ගිණුම් කටයුතු වෙනුවෙන් ලංසු කැඳවීම සඳහා වෙළඳපොල මිල සඳැහුම් ක්‍රමය භාවිතා කර ඇත. | ප්‍රසම්පාදන අත්පොත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (උ) | 2022 මැයි 09 දිනැති ප්‍රසම්පාදනය ප්‍රදානය කිරීමේ ලිපිය මඟින් SAGE 300 ERP Solution පරිගණක මෘදුකාංගය 2022 ජූනි 25 දිනට හෝ ඊට පෙර ස්ථාපිත කල යුතු වුවද, 2024 ජූනි මස 19 වැනිදා වන විට වැටුප් පිළියෙල කිරීමේ මොඩියුලය ස්ථාපිත කර ඇති නමුත් එය ක්‍රියාකාරී මට්ටමේ නොතිබුණි. ප්‍රසම්පාදන අත්පොතේ 2.4 වගන්තිය ප්‍රකාරව 2022 මැයි 06 දින පැවති තාක්ෂණික ඇගයීම් කමිටුවේ වාර්තාවෙහි එක් සාමාජිකයෙකු අත්සන් තබා නොතිබීම හේතුවෙන් එහි වලංගුතාවය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි විය. | වැටුප් පිළියෙල කිරීමේ මොඩියුලය (Payroll Module) නිසි පරිදි ස්ථාපිත කර ඇති මුත් අප විසින් සිදු කල යුතු දත්ත ඇතුළත් කිරීම් සිදු කරමින් පවතින බැවින්, එකී දත්ත ඇතුළත් කිරීම් අවසන් කර පරීක්ෂා කිරීමෙන් පසු සජීවීව ක්‍රියාකාරී තත්ත්වයෙන් මෙම මොඩුයුලය භාවිතයට ගත හැක. | ප්‍රසම්පාදන අත්පොත ප්‍රකාරව කටයුතු කළ යුතු වීම හා මෘදුකාංගයේ සියළු මොඩියුලයන් කඩිනමින් භාවිතයට ගත යුතු වීම. |